*සැ. යු.*– 2007.01.12 වැනි දින අංක 1,480 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,481 - 2007 ජනවාරි 19 වැනි සිකුරාදා - 2007.01.19

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 38 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 38 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජනවාරි මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජනවාරි මස 12 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

හික්කඩුව, තිරානගම පදිංචි ක්‍රිස්තෝම්බු බදුගේ බන්දුල ද සිල්වා වන මා විසින් හික්කඩුව, තිරානගම පදිංචි තුයියා හැන්නැදිගේ ලීලාවතී ද සිල්වාට වර්ෂ 2001 ක්වූ ජනවාරි මස 13 වන දින රංජනී ඊ කලුපහන ප්‍රසිද්ධ නොතාරිස්වරිය විසින් ලියා සහතික කරන ලද 7942 දරන ඇටෝර්නි බලපත්‍රය පිට පවරන ලද සියලු බලතල ද, එකී ඇටෝනි බලපත්‍රය ද, වර්ෂ 2006ක් වූ දෙසැම්බර් මස 11 වැනි දින සිට මා විසින් අවලංගු කරනු ලබන අතර, මින් ඉදිරිපිට මා වෙනුවෙන් ඇය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මම වග නොකියන බවට ශ්‍රී ලංකා ජනරජයට මෙයින් දැනුම් දෙමි.

නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස්.

වර්ෂ 2006 ක් වූ දෙසැම්බර් මස 09 වන දින දී ය.

01-318

## ඇටර්නි බලකර අවලංගු කිරීමයි

කොළඹ 05, එළිබැන්ක් පාර, අංක 01 හි දැනට එක්සත් රාජධානිය ෂාරේ, ක්‍රොයිඩන්, වයිට්හෝස් පාර, අංක 248 හි පදිංචි සැමුවෙල් විවේන්ද්‍ර එලියතම්බි වන මා විසින් නුගේගොඩ, සමන් මාවත, අංක 151/6 දරන ස්ථානයේ පදිංචි රෙජිනෝල්ඩ් පෙරේරා වික්‍රමආරච්චි යන අය මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු ලෙස පත් කරමින් ඔහු වෙත ප්‍රදානය කරන ලද එංගලන්තයේ ප්‍රසිද්ධ නොතාරිස් බැසිල් ප්‍රෙව්වේනියස් සහතික කළ 1997.12.01 දින දරන දිනපොත් අංක 1210 සහ 1998.02.13 දින යටතේ ලියාපදිංචි කරන ලද විදේශ ඇටර්නි බලපත්‍රය සහ මා විසින් ඉහත කී වික්‍රමආරච්චි යන අයටම ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. අයි. වීරවර්ධන විසින් ලියා සහතික කළ අංක 401 හා 1998.03.23 දාතම දරන දින පොතේ අංක 03321 හා 1998.05.06 දින යටතේ ලියාපදිංචි කරන ලද ඇටර්නි බලපත්‍රය වර්ෂ 2006.12.27 වන දින සිට බලපවත්වන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කොට, අහෝසි කොට අවලංගු කර සිටින බව ශ්‍රී ලංකා ජනරජයටත්, සියලුම ශ්‍රී ලංකා වාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

සැමුවෙල් විවේන්ද්‍ර එලියතම්බි.

01-327

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - නාරම්මල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය

### පදිංචියට සුදුසු ඉතා වටිනා දේපලක්

නාරම්මල කුලියාපිටිය මාර්ගයට ඉතා නුදුරුව කඩහපොල ගමේ, කටුපොත පාරේ පිහිටි ගුණවර්ධන වත්ත නැමැති ඉඩමෙන් බෙදූ කොටසක් හා එහි තුළ පිහිටි සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 45.5.

මෙම දේපල ජයසූරිය මුදියන්සේලාගේ විජේරත්න යන අය බන්ධනදායී වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2007 ක් වූ පෙබරවාරි මස 14 වන දින පෙ.ව. 10.30 ට දේපල පිහිටි, ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.06.23 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2006.06.12 වන දින, ද අයිලන්ඩ් පුවත්පත ද, 2006.06.13 වන දින තිනකරන් පුවත්පත ද සහ 2006.06.15 වන දින ලංකාදීප යන පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*– නාරම්මල නගර මධ්‍යයේ සිට කුලියාපිටිය මහා මාර්ගයේ කි.මී. 3 ක් පමණ කඩහපොල දක්වා ගමන්ගෙන දකුණට හැරී කටුපොත පාරේ ස්වල්ප දුරක් ගිය විට අදාල දේපල මෙම පාරේ දකුණු දෙසින් පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500. සියලුම ප්‍රචාරක වියදම් ද, ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයට හෝ නාරම්මල ශාඛාව වෙත ගෙවා නිම කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. කළමණාකරු කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,

අංක 55, මීගමුව පාර, නාරම්මල,
දුරකථන අංක : 037-2248549, 037-2249916-17
ෆැක්ස් : 037-2248550

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර, වටපුළුව, මහනුවර.

දුරකථන අංක : 081-2211025, 071-4755974, 071-4213497, 071-2755974
ෆැක්ස් : 081-2211025

01-302/1

## සීමාසහිත සෙලාන් බැංකුව - අනුරාධපුර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන)පනතේ 4 වන වගන්තිය

පදිංචියට, වගාවට සුදුසු දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමක්

අනුරාධපුර යාපනය හන්දියට ඉතා නුදුරුව යාපනය මහා මාර්ගයට මායිම්ව මාන්කඩවල ගමේ පිහිටි "මාන්කඩවල හේන (ඉහළ)" නැමැති ඉඩමෙන් බෙදූ කොටසක් හා එහි තුළ පිහිටි නිවස වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය (0.437 හෙක්ටයාර්) පර්චස් 172.70

මෙම දේපල අනුරාධපුර පදිංචි ගුණරත්න හෙට්ටිආරච්චිගේ අබේපාල සහ ගුණරත්න හෙට්ටිආරච්චිලාගේ රූපා ඉන්ද්‍රානි යන අය බන්ධනදායින් වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2007 ක් වූ පෙබරවාරි මස 07 වන දින පෙ.ව. 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2002.11.15 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2002.11.06 වන දින දිනමිණ, ඩේලිනිවුස්, සහ තිනකරන් යන පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*– අනුරාධපුර නගර මාධ්‍යයේ සිට යාපනය මහා මාර්ගයේ යාපනය හන්දිය පසුකර කි. මී. 4 ක් පමණ ගමන් ගත්විට 5/2 බෝක්කුව අසල හමුදා කඳවුර ඉදිරි පිටින් මෙම මහා මාර්ගයේ වම් පසින් අදාල දේපල පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.*–විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින දින 30 ක් ඇතුළත දී සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4701256, 011-2456258, 077-7736452

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.
අංක 83/5, බෝමලුව පාර, වටපුළුව, මහනුවර.

දුරකථන අංක : 081-2211025, 071-4755974, 071-4213497, 071-2755974
ෆැක්ස් : 081-2211025

01-302/2

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් - අනුරාධපුර ශාඛාව

සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය

පදිංචියට සුදුසු දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමක්

අනුරාධපුර නාච්චදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මහාරත්මලේ ගමෙහි පිහිටි " මහරත්මලේකැලේ " නැමැති ඉඩමෙන් බෙදූ කොටසක් හා එහි තුළ පිහිටි සියලු දේ, ඉඩමේ ප්‍රමාණය - පර්චස් 16.3.

මෙම දේපල අනුරාධපුර "දහයියාගම පාම් ෂොප්" යන නාමය විලාශය යටතේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සමරකෝන් මුදියන්සේලාගේ නිහාල් දිසානායක (ණයට ගන්නා) නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් සඳහා බැංකුවට සුරක්ෂිත කර ඇත.

2007 ක් වූ පෙබරවාරි මස 07 වන දින පෙ.ව. 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.12.29 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2006.12.15 වන දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකරන් යන පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*– අනුරාධපුර නගරයේ සිට මහා වීදිය ඔස්සේ දහයියාගම හන්දිය දක්වා පැමිණ පුබුදුපුර පාරට හැරී මීටර් 200 ක් පමණ ගමන් ගෙන දකුණට හැරී කි. මී. 01 ක් පමණ ගියවිට අදාල දේපල මෙම පාරේ දකුණු දෙසින් පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500. සියලුම ප්‍රචාරක වියදම් ද, ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් වෙත ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමණාකාරිනී - නීති, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් අංක 40, නවම් මාවත, කොළඹ 02. දුරකථන - 011-2437701-10

අයි. ඩබ්ලිව්. ජයසූරිය
අධිකරණ හා වාණිජ බැංකු වෙන්දේසිකරු

අංක 83/5, බෝමළුව පාර, වටපුළුව,
මහනුවර.

දුරකථන : 081 - 2211025, 071-4755974, 071-4213497, 071-2755974
ෆැක්ස් : 081 - 2211025

01-302/3

## සීමාසහිත සෙලාන් බැංකුව - නුගේගොඩ ශාඛාව මගින්

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමක්

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ මිශ්‍ර වගාවන් (කජු සහ අඹ) සහිත ඉතා වටිනා කෘෂි කාර්මික දේපලක්

ආනමඩුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ බංගදෙනිය ආනමඩුව (පල්ලම හරහා) මහා මාර්ගයට ඔබ්බෙන් නාගවිල වේලේගම ගම්වල පිහිටි FVP1831 හා FVP1832 හි සඳහන් කැබලි අංක 52 සහ 53 දරන ඒකාබද්ධ ඉඩම් කැබැලි දෙක සහ එහි පිහිටි වගාව ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය : අක්කර 25, පර්චස් 20.

මෙම දේපල නාවල පදිංචි විජයවර්ධන විජේපාල පලිහවඩන රුවිනි නිරෝෂා පලිහවඩන සහ රිකාඩෝ ඩේමියන් රොයිස්ද ලිමා යන අය බන්ධනදායින් වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇති දේපල වේ.

2007 ක්වූ පෙබරවාරි මස 14 වන දින දී ප. ව. 2.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.10.27 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2006.10.11 වන දින ඩේලිමිරර්, ලංකාදීප පුවත්පත් ද 2006.10.25 වන දින වීරකේසරි යන පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*– හලාවත පුත්තලම මාර්ගයේ බංගදෙනිය හන්දිය දක්වා ගමන් ගෙන දකුනට හැරී ආනමඩුව පාරේ (පල්ලම හරහා) කි. මී. 23 ක් පමණ ආඩිගම දක්වා පැමිණ දකුණු දෙසින් පිහිටි ජය මාවතට පිවිස මීටර් 700 ක් පමණ ගිය විට අදාල දේපල පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000 ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 සියලුම ප්‍රචාරක වියදම් ද, ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතුවේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :

ප්‍රධාන කළමණාකරු (නීති)
සීමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල.
අංක 90, ගාලු පාර, කොළඹ 03.
දුරකථන : 011-4701256, 011-2456258, 077-7736452

අයි. ඩබ්ලිව්. ජයසූරිය.
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු
අංක 83/5, බෝමලුව පාර, වටපුළුව, මහනුවර.

දුරකථන : 081-2211025 071-4755974, 071-4213497, 071-2755974
ෆැක්ස් : 081-2211025

01-302/4

## මහජන බැංකුව - (පුරහල ශාඛාව)

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකිණීමයි

### ඉතා අගනා දේපල ප්‍රසිද්ධ වෙන්දේසිය

"බෝගහවත්ත" නැමති ඉඩමෙන් සාදන ලද අංක 261 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 20 සහ ලොට් අංක 21 වශයෙන් දැක්වෙන ඇතුල් කෝට්ටේ, කෝට්ටේ පාරේ, වරිපනම් අංක 883/9 දරන ප්‍රමාණයෙන් (ලොට් අංක 20 සහ ලොට් අංක 21) අක්කර 0, රූඩ් 0, පර්. 9.70ක අගනා බිම් කොටස එහි පිහිටි ගොඩනැගිලි හා අනෙකුත් සියලුම දේ සමග, මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය පරිදි ඉහත කී දේපල 2007 පෙබරවාරි මස 3 වන සෙනසුරාදා පෙ. ව. 11.00ට පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුව විසින් සම්මත කරගනු ලැබූ 1997.05.16 දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ පුවත්පත්වල පල කරන ලද යෝජනා සම්මුතිය බලන්න.

*දේපල වෙත ලඟා වන අන්දම.*– බොරැල්ල සිට ශ්‍රී ජයවර්ධනපුර සැණකෙළි ධාවනපථය ඔස්සේ ගමන් කොට කෝට්ටේ හන්දිය පසුකොට උස්වත්ත මාවත දක්වා ගොස් එම මාවතේ ඉදිරියට ගියවිට හමුවන බොරළු පාරට හැරී ආසන්න වශයෙන් යාර 100ක් පමණ ගියවිට වම් පස පිහිටි අදාල දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*– මිල තීන්දුවනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවීමට සිදුවේ.

1. ගැණුම් මිලෙන් 10%.
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු බද්ද පළාත් අධිකාරි බද්ද ගැණුම් මිලෙන් 1%ක්,
3. 2 1/2%ක් වන (සියයට දෙකහමාරක් වන) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500යි.
5. විකිණීමේ පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා.
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තුව.

ගැණුම් මිලෙන් ඉතිරි 90% මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත, කොළඹ 01, ආදිපාද වීදිය, අංක 11, මහජන බැංකුව (බස්නාහිර කළාප) සහකාර සාමාන්‍යාධිකාරි වෙත ගෙවිය යුතුය. දුරකථන අංක : 2393678, ෆැක්ස් අංක : 2435977

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ ලිපිලේඛන පූර්වෝක්ත ලිපිනයෙන් ලබාගත හැකිය. ඉහත සඳහන් පරිදි එකී මුදල දින 30ක් ඇතුළත ගෙවනු නොලැබුවේ

නම් ගැණුම් මිලෙන් දැනටමත් ගෙවා ඇති 10% (සියයට දහය) අහිමි කොට දේපල නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුය.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී, වරලත්
වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය :*

අංක 24, ටොරින්ටන් පාර, මහනුවර.
දුරකථන : 081-2227593
දුරකථන/ෆැක්ස් : 081-2224371

*නගර කාර්යාලය :*

අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05.
දුරකථන : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් : 011-2588176
ඊ-මේල් : samera@sri.lanka.net

01-310

---

## සීමාසහිත සෙලාන් බැංකුව - අම්බලන්ගොඩ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 4 වන වගන්තිය යටතේ විකිණීමයි

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිට කෝරලේ කොස්ගොඩ ගොඩගම පිහිටි කන්දේ ලියන රාලලාගේ වත්ත *හෙවත්* පැලවත්ත නැමැති බිම සහ ගස් ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියළු දේ සමග රූඩ් 03 යි පර්චස් 2 ක් (රූ. 3, පර්. 2) විශාල ඉඩම. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී 381/44 යටතේ ලියාපදිංචි කර ඇත.

පෙර කී ඉඩම මිනුම් සැලැස්මක පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිට කෝරලේ කොස්ගොඩ, ගොඩගම පිහිටි කන්දේලියන රාලලාගේ වත්ත *හෙවත්* පැලවත්ත ඉඩමේ ඒ ලකුණු කළ බිම සහ ගස් ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියළු දේ සමග බලයලත් මිනින්දෝරු ඩී. බර්ටි ඒ. ද සිල්වා විසින් සාදන ලද 1986.02.26 දිනැති අංක 2450 දරන සැලැස්ම අනුව රූඩ් 3 යි පර්චස් 2 (රූ. 3, පර්. 2) විශාල ඉඩම.

මෙම දේපල අළුත්ගම පදිංචි යාගම වාරක රංගජිත් ද සිල්වා යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල 2007 පෙබරවාරි මස 08 දින පෙ.ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2006.09.15 වන දින ද ලංකාදීප සහ ඩේලිමිරර් යන පුවත්පත් වල 2006.08.28 වන දිනද වීරකේසරි පුවත් පතේ 2006.08.24 දින ද පළ වී ඇත.

*දේපලට පිවිසීම.*– කොළඹ සිට ගාලු පාරේ ගොස් කොස්ගොඩ පොලිස් ස්ථානය පසුකර ගිය විට හමුවන හතර මං හන්දියෙන් වමට ඇති පාරේ ගොස් වෙලන්ගොඩ පාරට හැරී මීටර් 400 ක් පමණ ඉදිරියට ගිය විට අදාල දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*– සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්) 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% ක් වන පළාත් අධිකාරි බද්ධ (සියයට එකක්) 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයේ 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500 6. සියළුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90%ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතුය. හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරි (නීති) සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන : 011- 2456285, 2456263, 2456284.

ටී. ඇන්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දු. අ. 011-2696155, 011-2572940

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු.

01-326

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 10/60886/ඩී10/391.

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002.11.22 *ගැසට් පත්‍රයේ* සහ 2003.06.28 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මාතර, කොටුවේ, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත, අංක 39හි බලයලත් වෙන්දේසිකාර, එම්. එච්. පී. සිරිවර්ධන මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2007.02.24 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත දිස්ත්‍රික් ආදායම් නිලධාරි කොට්ඨාසයේ අම්බල පිහිටි මිරිස්වත්ත *හෙවත්* ඕවර්සියර්වත්ත නමැති ඉඩමේ සර්වේයර් ජනරාල්වරයා විසින් සකසන ලද 1996.10.17 සින අ.ග.පි. අංක 300 දරන මිණුමේ පිඹුරේ කැබලි අංක 345 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් රූ. 2 පර්. 6 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙය තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක LDO Ham/Pra 11990හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2007 ජනවාරි මස 05 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-328/1

---

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 10/67134/ඩී10/577.

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002.12.20 දින *ගැසට් පත්‍රයේ* සහ 2003.11.01 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මාතර, කොටුව, විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39හි බලයලත් වෙන්දේසිකාර, එම්. එච්. පී. සිරිවර්ධන මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2007.02.24 වැනි දින පස්වරු 4.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අබේසේකරගම ග්‍රාමසේවක කොට්ඨාසයේ අඟුණකොලපැලැස්ස දිස්ත්‍රික් ආදායම් නිලධාරි කොට්ඨාසයේ දික්වැව ගමේ පිහිටි වැවගාවයාය නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු අයි. කොතඹගේ විසින් සකසන ලද 1998.03.05 දින හා වඩාත් නිවැරදිව 1998.04.05 දින හා අංක 2946 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 2 පර්. 32ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග සහ එකී පිඹුරේ පෙන්වා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක Ham/ 16/232/86 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2007 ජනවාරි මස 05 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-328/2

---

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 10/61519/ඩී/10/415.

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2000.14.20 දින *ගැසට්* පත්‍රයේ සහ 2002.11.30 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවියයුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මාතර කොටුව, මාතර, විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39හි බලයලත් වෙන්දේසිකාර, එම්. එච්. පී. සිරිවර්ධන මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2007.02.24 වැනි දින පස්වරු 1.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශිය සභා සීමාව තුල නලගම පිහිටි කෝන්ගහහේන, අලහේන, කොමෙහේන සහ ළිදමණ්ඩිය නමැති ඉඩමේ බලයලත් මිනිදෝරු ඩී. යූ. අබේගුනවර්ධන විසින් සකසන ලද 1994.11.30 දිනැති හා අංක 1077 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 සහ 4 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් පර්. 39.6 ක් වූ හා පර්. 29.5 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස් සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක F 140/ 237 සහ 140/225 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2007 ජනවාරි මස 05 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-328/3

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 9/70239/ඉසඩ්9/698.

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002.11.22 *ගැසට් පත්‍රයේ* සහ 2003.07.05 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කොටුව, මාතර, විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39හි බලයලත් වෙන්දේසිකාර, එම්. එච්. පී. සිරිවර්ධන මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2007.02.24 වැනි දින පෙරවරු 9.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය සභා සීමාව තුල කපුගම පිහිටි මහවත්ත හෙවත් කොන්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ජේ. සමරපාල විසින් සකසන ලද 1998.02.25 දින හා 1998.03.04 දින හා අංක 1013 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් පර්. 17.35 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක බී 559/101 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරි.

2007 ජනවාරි මස 05 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-328/4

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : කේ/12/1988/කේවයි2/614.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ 2003.09.26 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.09.06 වැනි දා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය බදුල්ල. කලුගල්පිටිය, අංක 48/1 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. ජයතිලක මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2007.02.10 වැනි දින පස්වරු 3.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

බදුල්ල දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ආදායම් නිලධාරි කොට්ඨාසයේ (වඩාත් නිවැරදිව මහියංගනය ආදායම් නිලධාරි කොට්ඨාසය)සේනානිගම ග්‍රාම සේවා වසමේ පගරගම්මන ගමේ පිහිටි දම්බරාව පහරගම්මන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. කුමාරසාමි විසින් සකසන ලද 1996.07.11 දිනැති හා අංක 10327 දරන පිඹුරේ කැබලි අංක 1119 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 1 රූ. 2 ක් වූ බෙදා වෙන්කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක එල්. ඩී. ඕ. 132/1995 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරි.

2007 ජනවාරි මස 05 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-328/5

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ4/2181/කේවයි2/527.

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ 2001.10.19 දින *ගැසට් පත්‍රයේ* සහ 2002.07.27 වැනි දා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය බදුල්ල, කලුගල්පිටිය, අංක 48/1හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. ජයතිලක මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2007.02.10 වන දින පෙරවරු 10.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ උඩ පළාත ප්‍රාදේශීය සභා සීමාවේ තුන්දෙනිය හි පිහිටි පහලගෙදරවත්තේ කොටසක් නම් වූ ඉඩමෙන් බලයලත් මිනින්දෝරු බී. එම්. එස්. බී. කරුනාරත්න විසින් සකසන ලද 1996.12.12 දිනැති හා අංක

3619 දරන පිඹුරේ කැබලි අංක 7 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් පර්. 17 ක් වූ බෙදා වෙන් කළ මුළු බිම් කොටස වේ.

මෙය ගම්පොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක සී 152/19 හි ලියා පදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර, කොළඹ 03.
2007 ජනවාරි මස 05 වැනි දින.

01-328/6

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීමයි.

ණය අංක : එම්9/176/එම්ටී1/93.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002.05.31 දින *ගැසට් පත්‍රයේ* සහ 2003.08.30 වැනි දා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය මාතර කොටුව, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත, අංක 39 හි බලයලත් වෙන්දේසිකාර එම්. එච්. පී. සිරිවර්ධන මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේදී 2007.02.24 වෙනි දින පෙරවරු 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ පාතේගම බෙලිඅත්ත පිහිටියාවූද ඉහල බෝගහවත්ත *හෙවත්* බෙට්ටිහන්දිගෙවත්ත *හෙවත්* බෝගහවත්ත, තලගහකොරටුව සහ ජූල්ගහකොරටුව, අඹිල්ලගහකොරටුව කනත්ත, දියගහකොරටුව සහ සියඹලාගහකොරටුව නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එන්. ජී. ඊ. ඩයස් විසින් සකසන ලද 1979.06.20 දිනැති හා අංක 2272 දරන පිඹුරේ කැබලි අංක 3 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් පර්. 6.21 ක් වූ බෙදා වෙන් කළ බිම කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක බී 424/127 හි ලියා පදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී,

අංක 269, ගාලු පාර, කොළඹ 03.
2007 ජනවාරි මස 05 වැනි දින.

01-328/7

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරිය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

පොල්ගොල්ල, පල්ලියවල, අංක 68 දරන ස්ථානයේ පදිංචි එස්. එම්. තව්පීක් මයා විසින් උකස් කරන ලද දේපල

ණය යොමු අංකය : ඩබ්ජ්ටී/125/2000.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.03.26 දිනැති අංක 1,334 දරන ගැසට් පත්‍රයේ හා 2004.03.19 දිනැති "දිනමිණ," "තිනකරන්," හා "ඩේලිනිවුස්" යන පුවත්පත්වල පළකරන ලද යෝජනාවකට අනුකූලව මුල් මුදල් ශේෂය ද විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය, ගාස්තුව හා එකී ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකරගත හැකි මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපොළ හා පරිශ්‍රය පිහිටි ස්ථානයේ දී 2007.02.28 වෙනි දින පෙරවරු 11.00 ට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ මහ නගර සභා සීමාව තුළ, මහදෙවට පාරේ පිහිටි, බලයලත් මිනින්දෝරු තැන වන ආර්. කනගරට්නම් මයා විසින් සාදන ලද 1974 මාර්තු මස 27 වන දිනැති අංක 960 දරන පිඹුරේ පෙන්නුම් කර ඇති, "ගෙදර වත්ත යැයි හඳුන්වනු ලබන ඉඩමෙන් කොටසක්" වන, ඉහත කී පිඹුර අනුව, උතුරට : වරිපනම් අංක 27 දරන ස්ථානය ද, නැගෙනහිරට : මහදෙවට පාර ද, දකුණට :. වරිපනම් අංක 23 දරන ස්ථානය ද, බස්නාහිරට : පී. බී. ඇල්ලේපොල ට අයත් ඉඩම ද මායිම් වූ පර්චස් පහළොවයි දශම පහක (පර්. 15.5) ප්‍රමාණයෙන් යුත් වරිපනම් අංක 25 දරන නිවස සමග වූ, බෙදා වෙන් කරන ලද සියළු ඉඩම් කොටස හා එහි තුළ පිහිටි සෑම සියලු දේ ද වේ.

ඉහත කී ඉඩම අළුතින් මනින ලදුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

ඉහත කී පරිදි මාතලේ මහනගර සභා සීමාව තුළ, මාතලේ, මහදෙවට පාරේ පිහිටි, බලයලත් මිනින්දෝරු තැන වන එම්. රාජසේකරන් මයා විසින් සාදන ලද 2000 මැයි මස 15 වෙනි දිනැති අංක 5116 දරන පිඹුරේ පෙන්නුම් කර ඇති, වරිපනම් අංක 25 දරන "ගෙදර වත්ත" යැයි හඳුන්වනු ලබන, නැගෙනහිරට : මහදෙවට පාර ද, දකුණට : වරිපනම් අංක 23 දරන ගොඩනැගිල්ල සිරිපාල විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, බස්නාහිරට පී. බී. ඇල්ලේපොළට අයත් දැනට රිස්වි නැමැත්තා විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, උතුරට : වරිපනම් අංක 27 දරන, දැනට බසීර් නැමැත්තා විසින් හිමිකම් කියනු ලබන ස්ථානය ද මායිම් වූ, පර්චස් පහළොවයි දශම පහක (පර්. 15.5) ප්‍රමාණයෙන් යුත් මහදෙවට පාර, වරිපනම් අංක 25 දරන ස්ථානය සමග වූ ඉඩම් කට්ටිය හා එහි තුළ පිහිටි වගාවන් හා සෑම සියළු දේද වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 74/292 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. බී. ඒකනායක,
කළමනාකරු.

ලංකා බැංකුව,
වත්තේගම.

01-329

## ලංකා බැංකුව

### වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

**ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරිය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම**

ණය යොමු අංකය : 57/05.

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.06.02 දිනැති අංක 1448 දරන ගැසට් පත්‍රයේ හා 2006.05.26 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එහි ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2007.03.08 වෙනි දින පෙ.ව. 11.00 ට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ මැදුරේ කෝරලයේ පානගමුවෙහි පිහිටි වඩා නිවැරදි හාදිරාමුල්ල හි පිහිටි "තුත්තිරිපිටියහේන" නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු සෙනරත් විජේරත්න විසින් සාදන ලද 1994.09.06 දිනැති අංක 1593 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් විස්තර කළ ඉඩම් කැබැල්ල,

| | |
|---|---|
| උතුරට | : එෆ්. වී. පී. 2636 හි ලොට් 105 සහ එෆ්. වී. පී. 2636 හි ලොට් 19 ද, |
| නැගෙනහිරට | : ගෝරුමඩ සිට ප්‍රධාන පාරට ගමිසභා පාරද, |
| දකුණට | : අංක 1593 දරන පිඹුරේ එස්. එම්. ජේ. ආබ්දීන්ට වෙන් කළ ලොට් 2 ද, |
| බස්නාහිරට | : එෆ්. වී. පී. 2636 හි ලොට් 105 ද මායිම්ව රූඩ් දෙකයි පර්චස් තිස්දෙකයි දශම පහක් (රූ. 2, පර්. 32.5) හෝ හෙක්ටයාර් බිංදුවයි. දශම දෙකයි අටයි හතරයි එකක් (හෙක් : 0.2841) බිම් ප්‍රමාණය සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ වේ. |

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1216/236 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ජී. ටී. අමරසිංහ,
කළමනාකරු.

ලංකා බැංකුව,
රිදීගම ශාඛාව.

01-331